www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජාත්‍යන්තර මූල්‍ය අරමුලේ නය පිලිබඳ අවිනිශ්චිතතාව ශ්‍රී ලංකා මුල්‍ය අර්බුදය ගැඹුරු කරයි

## Uncertainty over IMF bailout deepens Sri Lankan financial crisis

**සමන් ගුනදාස විසිනි**

**2009 මැයි 16**

ශ්‍රී ලංකාවේ උතුරේ කෙරීගෙන යන බිහිසුනු සටන් මධ්‍යයේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් (ජා.මූ.අ.) ලැබීමට නියමිත එ.ජ. ඩොලර් බිලියන 1.9 ක නය මුදල ප්‍රමාද කරවන බවට එක්සත් ජනපදය (එ.ජ.) සහ බ්‍රිතාන්‍යය ඉඟි කර තිබේ. එම තීරනය කොලඹ මූල්‍යමය අර්බුදය උග්‍ර කිරීමට තුඩු දෙනු ඇත.

බ්‍රහස්පතින්දා වොෂින්ටනයේදී, එ.ජ. රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් ප්‍රකාශ කලේ; "මෙවර ශ්‍රී ලංකාවට ජා.මූ.අ. නය දීම ගැන අපි ප්‍රශ්න කර තිබෙනවා... මෙම ගැටුමට විසඳුමක් ලැබෙන තුරු එය සලකාබැලීමට සුදුසු කාලයක් නොවන අතර අප අවධානය යොමු කරන්නේ එයටයි."

ක්ලින්ටන්ගේ ප්‍රකාශයට පසුව, "ඉවක් බවක් නැති බෝම්බ හෙලීම්" නතර කරන ලෙස කොලඹ රජයට ද, ආයුධ බිම තබන ලෙස බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටින්ට ද (එල්ටීටීඊ) එ.ජ. ජනාධිපති බැරැක් ඔබාමා කියා සිටියේය. සටන් නිසා හිරවී සිටින 50,000 ක් පමන වෙතැයි සැලකෙන සිවිල් ජනතාවට ලඟාවීමට එක්සත් ජාතීන්ට ඉඩ සලසන ලෙස දෙපාර්ශවය ම පොලඹවමින්, "හදිසි ක්‍රියාමාර්ගයක් නොමැතිව මෙම මානුෂීය අර්බුදය මහා විපත්තියකට පෙරලිය හැකියැ"යි ඔහු ප්‍රකාශ කලේය.

ගිය සඳුදා බ්‍රිතාන්‍ය විදේශ ලේකම් ඩේවිඩ් මිලිබෑන්ඩ් මෙවැනි ම ප්‍රකාශනයක් ඉදිරිපත් කලේ, "ජා.මූ.අ.හි මුදල්, වගකීමෙන් හා යෝග්‍ය ලෙස පාවිච්චි කරන බව පෙන්වීමට ඕනෑම රජයකට හැකියාව තිබීම අත්‍යාවශ්‍යය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් තවමත් එය එසේ වේ යැයි මම නොසිතමි"යි පවසමිනි. බ්‍රිතාන්‍ය ස්ථාවරයට තමන් සහයෝගය දක්වන බව ප්‍රන්ස විදේශ ඇමති බර්නාඩ් කවුච්නර් හැඟවීය.

එල්ටීටීඊය සතුව පවතින ඉතිරි කිලෝමීටර් කිහිපය සඳහා වන සටනේදී මානුෂීය ඛේදාන්තයක් නිසැකව ම එලිදැක්වෙනු ඇත. සිවිල් ජනතාවගේ ඉරනම පිලිබඳ පූර්න නොතැකීමෙන් යුතුව ශ්‍රී ලංකා හමුදාව තම ආක්‍රමනය ගෙනයන බැවින් මිනිසුන් ගැහැනුන් සහ ලමුන් සිය ගනනක් මරනයට පත්ව සහ තවත් බොහෝ දෙනෙක් තුවාල ලබා ඇත. මේ සතියේ දෙවතාවක් ම යුද මුක්ත කලාපයේ ස්ථාපිත එකම තාවකාලික ආරෝග්‍යශාලාවට හමුදාව විසින් ෂෙල් වෙඩි දමනු ලැබිනි. ගිය සෙනසුරාදා පටන් තම නෞකාවන්ට ඒවායේ සීමිත සැපයුම් පවා ගොඩබාන්නට ඇති නොහැකියාව පෙන්වා දෙමින් තම කාර්ය මන්ඩලය "සිතාගත නොහැකි මහා මානුෂීය විපත්තියක" සාක්ෂිකරුවන් වෙමින් සිටින බව ජාත්‍යාන්තර රතු කුරුස කමිටුව ප්‍රකාශ කලේය.

කෙසේ වුවද, එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය සහ ප්‍රන්සය යුද අපරාධ සම්බන්ධව ශ්‍රී ලංකා රජය හෙලා දැක නැත. 2002 සටන් විරාමය නොතකා දූපත නැවතත් සිවිල් යුද්ධයකට ඇද දැමූ ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂට පසුගිය අවුරුදු තුන මුලුල්ලේම මෙම රටවල් තුනෙහි ම සහාය ලැබිනි. තම ආර්ථික සහ උපායමාර්ගික අවශ්‍යතා, ශ්‍රී ලංකාවේ සහ පුලුල් කලාපයක, විශේෂිතව ම යුද්ධය විසින් හටගැනුනු පුලුල්ව පැතිරුන විරුද්ධත්වයක් සහිත ඉන්දියාවේ ද පතුරුවන්නට, තමන්ගේ ම ක්‍රියාමාර්ගයන්ගේ උදව්වෙන් නිර්මානය කෙරුනු මානුෂීය ව්‍යසනය, මෙම ප්‍රධාන බලවේග ගසාකමින් සිටිති.

අඩු වශයෙන් තාවකාලිකව, මෙම ජා.මූ.අ. නය මුදල නැවැත්වීම නිසා ශ්‍රී ලංකා රජය බරපතල මූල්‍යමය අර්බුදයක ගිලෙනු ඇත. පසුගිය සැප්තැම්බරයේ ඇතිවුනු ගෝලීය මූල්‍ය කඩාවැටීම නිසා සිය යුද්ධයට ගෙවීම සඳහා රට උකසට තැබූ රාජපක්ෂ විදේශ විනිමය අර්බුදයකට මුහුන දී ඇත. සැප්තැම්බරයේදී එ.ජ. ඩොලර් බිලියන 3.1 ක් වූ විදේශ සංචිත පෙබරවාරියේදී සති හයක ආනයන සඳහා පමනක් ප්‍රමානවත් වන, ඩොලර් බිලියන 1.1 ක් දක්වා පහත වැටීම නිසා ජා.මූ.අ. වෙත හැරීමට කොලඹට බල කෙරින.

සටන් විරාමයක් සඳහා ජාත්‍යන්තර ඉල්ලීම් රාජපක්ෂ දිගින් දිගටම ප්‍රතික්ෂේප කලේය. ඊයේ ජෝර්දානයේදී ශ්‍රී ලාංකික සංක්‍රමනික කම්කරුවන් අමතමින් පැය 48 ක් ඇතුලත හමුදාව එල්ටීටීඊය අවසන්

කරනු ඇතැයි ඔහු ප්‍රකාශ කලේය. තම ජනවාර්ගික යුද්ධයේ අවසානය සාමය සහ සෞභාග්‍යය කරා ගෙන යනු ඇතැයි කොලඹ ආන්ඩුව ප්‍රකාශ කරන නමුදු ගැඹුරුවන ආර්ථික අර්බුදයෙන් පැහැදිලි වන්නේ යුද්ධයේ අවසානය කම්කරු පන්තියට එරෙහි ආක්‍රමනයක පෙර ගැයුම පමනක් වන බවයි.

මේ දිග් ගැසුනු ගැටුම කෙසේවත් ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක් නොවූ නමුත් තම දෙමල විරුද්ධ පාර්ශ්වයේ සහ සමස්තයක් ලෙස වැඩ කරන ජනතාවගේ වියදමින් සිංහල ප්‍රභූවේ වරප්‍රසාද ස්ථාපිත කරන යුද්ධයකි. එල්ටීටීඊය ට එරෙහි හමුදා ජයග්‍රහන වසර 26 ක යුද්ධයේදී ස්ථාපිත කල පොලිස් රාජ්‍ය බලතල වැඩ කරන ජනතාවගේ ඕනෑම විරෝධතාවකට එරෙහිව පාවිච්චි කරන්නට යොදාගැනීමට පසුබට නොවන කොලඹ සිටින පාලක ප්‍රභූවේ වඩාත් ප්‍රතිගාමී තට්ටුවල දෑත් ශක්තිමත් කිරීම සඳහා පමනක් යෙදවෙනු ඇත.

මේ සතියේ ව්‍යාපාරික විධායකයින් ආමන්ත්‍රනය කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් ලග එන මූල්‍යමය අර්බුදය සම්බන්ධව ඇති බිය තුනීකරන්නට උත්සාහ කලේය. විදේශ සංචිත ඉහල නංවන්නට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නය මුදලට අමතරව ශ්‍රී ලංකාව වෙනත් රටවල් සමග විකල්ප සැලැස්මක් සකසමින් සිටින ඔහු පැවසීය. මාර්තුවේ දී මහ බැංකුව මැලේසියාවෙන් ඩොලර් මිලියන 200 ක නයක් ලබා ගත්තේය. ඩොලර් මිලියන 500 ක නයක් සඳහා ලිබියාව සමග සාකච්ඡා පැවැත්වෙමින් තිබෙන බව කබ්රාල් පැවසුවේ නමුදු මෙම සාකච්ඡා මාස දෙකක් පුරා ඇදෙමින් පවතී.

ශ්‍රී ලාංකික ආර්ථිකය විවිධ ප්‍රශ්නවලින් වෙලී පවතියි. ගිය වසරේ කාලසීමාව සමග සැසඳීමේදී මෙම වසරේ පලමු මාස දෙකෙහිදී අපනයන සියයට 10.7 කින් පහල බැස ඇත. වෙලඳ හිගය අඩුවූයේ නමුත් ඒ ආනයන සියයට 37 කින් පහල ගිය බැවින් පමනි. වර්තමාන ගිනුම් ශේෂය රුපියල් බිලියන 72.3 ක් (එජ ඩො මිලියන 610) කරා දිගටම ඉහල ගොස් ඇත. ගිය වසරේ රුපියල් බිලියන 159.5 ක් වූ රජයේ වියදම මෙම වසරේ දෙමාසය සමග සැසඳීමේදී රුපියල් බිලියන 195 ක පිම්මක් පැන ඇති අතර ගිය වසරේ රුපියල් බිලියන 102.8 ක් වූ රජයේ ආදායම මෙම වසරේ රුපියල් බිලියන 90.8 කට පහල බැස්සේය.

පසුගිය සතියේ නිකුත් කෙරුන ආසියා පැසිපික් කලාපය සඳහා වන ජාමූඅ ලේ ආර්ථික ලේඛනයෙන් 2008 දී සියයට 6 ක් වූ ආර්ථික වර්ධනය මේ වසරේදී සියයට 2.5 ක් දක්වා ඇද වැටෙන අතර අයවැය හිගය දදේනි යෙන් සියයට 9 ක් දක්වා ඉහල යන බවට අනාවැකි පල කොට ඇත. 2008 ජනවාරි-පෙබරවාරි වලදී රුපියල් ට්‍රිලියන 3.14 ක් වූ රාජ්‍ය නය රුපියල් ට්‍රිලියන 3.65 ක් කරා ඉහල නැග ඇත. ලංකා බිස්නස් ඔන්ලයින් ට අනුව තම මූල්‍යමය තත්වය ගැට ගසා ගැනීමට ගිය සැප්තැම්බරයේ සිට ආන්ඩුව අඩුම තරමින් රුපියල් බිලියන 200 ක් අච්චු ගසා ඇත.

ගැඹුරුවන ආර්ථික අර්බුදයෙන් දැනටමත් සමාගම් වලට පහර වැදී ඇති අතර දහස් ගනන් රැකියා නෙරපීම් එහි ප්‍රතිපල වී ඇත. පසුගිය වසර හා සැසඳීමේදී කොලඹ කොටස් වෙලඳපොලේ ලැයිස්තුගත සමාගම් 212 ක ලාභ දෙසැම්බර් කාර්තුවේ දී සියයට 68 ක සාමාන්‍යයකින් පහල බැස ඇති බව සීටී ස්මිත් ස්ටොක් බ්‍රෝකර්ස් පැවසීය. රටෙහි ප්‍රධාන ජංගම දුරකතන සමාගම වන ඩයලොග් ටෙලිකොම් සේවකයන් සිය ගනනක් නෙරපා හැර ඇත මාස් හෝල්ඩිංස් සහ බ්‍රැන්ඩික්ස් වැනි විශාලතම නිමි ඇඳුම් අපනයනකරුවන් කම්හල් කිහිපයක් වසා දමා සිය ගනනකගේ රැකියා කප්පාදු කර තිබේ.

ජාමූඅ හි නය මුදල ඇතිව හෝ නැතිව, රාජපක්ෂ රජය කම්කරුවන්ගේ ජීවන තත්වයන් මතට පහර එල්ල කිරීමට සැරසෙමින් සිටී. මෑතක දී පැවැත්වූ, බස්නාහිර පලාත් සභාවට අලුතෙන් තේරී පත් වූ සභිකයන්ගේ දිවුරුම් දීමේ උත්සවයේ දී කතාකරමින් රාජපක්ෂ පැවසූයේ; "(අපේ) වීර සොල්දාදුවන් අවුරුදු 30 ක් පැරනි ත්‍රස්තවාදී තර්ජනය සම්පූර්නයෙන්ම වාගේ අතුගා දමා ඇති අතර කෲර යුද්ධයේ අවසන් අදියරෙහි අන්තිම අවස්ථාවේ අපි සිටිමු. දැන්, වේලාව ආර්ථික යුද්ධය සඳහාය" යනුවෙනි.

ගිය මාසයේදී, ජාමූඅ සමග සාකච්ඡා පැවැත්වෙමින් තිබියදී, වියදම් කපා හැරීම් වස් රජය කප්පාදු වැඩපිලිවෙලක් නිවේදනය කලේය. රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම් සහ බඳවාගැනීම් නවතාදැමීම, පුද්ගලික අංශයේ රැකියාවලින් නෙරපීමේ අවහිර ලිහිල් කිරීම, එජ ඩොලරයට සාපේක්ෂව රුපියල පාවෙන්නට ඉඩ හැරීම, රාජ්‍ය සහනාධාර කපාහැරීම, සහ ආනයන හා පාරිභෝගික බදු ඉහලනැංවීම ඒවා අතර වේ.

දෙමල සුලුතරයට එරෙහි යුද්ධය, ජනවාර්ගික ආතතීන් අවුලුවා කම්කරු පන්තිය බෙදන්නට සහ දුර්වල කරන්නට, කොලඹ ආන්ඩුවලට සැමවිටම ආධාරවිය. දැන් ජාතිය ගොඩනගන්නට යන නාමයෙන්, යුද්ධය මගින් නිර්මානය වුන මූල්‍යමය අර්බුදයේ බර වැඩ කරන ජනතාවගේ කරමතට පටවන්නට, රාජපක්ෂ "ආර්ථික යුද්ධයක්" සංවිධානය කරමින් සිටී.